සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# කෘෂි විද්‍යාව - I

13 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.

---

01 ශාක හෝර්මෝන කාණ්ඩයක පහත ගුණාංග ඇත.

A - සෛල විභාජනය හා දික්වීම ඇති කරයි.

B - අග්‍රස්ථ ප්‍රමුඛතාව ඇති කරයි.

C - මුල් වර්ධනය ආරම්භ කරයි.

D - ඡේදනය නිශේදනය කරයි.

මෙම හෝර්මෝන කාණ්ඩය,

(1) ගිබෙරලීන් වේ. (2) එතිලීන් වේ.
(3) ඇබ්සිසික් අම්ලය වේ. (4) සයිටොකයිනීන් වේ.
(5) ඔක්සීන් වේ. (......)

02 පරපරාගණයට අනුවර්තනයක් වනුයේ,

(1) විසංයෝගතාව වේ. (2) විවෘත නොවූ පුෂ්ප වේ.
(3) ද්විලිංගික පුෂ්ප වේ. (4) ඒක ගෘහිතාව වේ.
(5) ස්ව අසංගතිය වේ. (......)

03 මැටි ඛණිජ අංශුන්ගේ ප්‍රමාණය (විෂක්ම්භය මිලි මීටර),

(1) 0.002 ට වඩා අඩු වේ. (2) 0.0002 ට වඩා අඩු වේ.
(3) 0.001 ට වඩා අඩු වේ. (4) 0.02 සිට 0.02 අතර වේ.
(5) 0.002 සිට 0.02 අතර වේ. (......)

04 පැළ කීඩෑවා අයත් වන ගෝත්‍රය,

(1) ඕතොප්ටෙරා වේ. (2) හෝමොප්ටෙරා වේ. (3) ඩිමෙප්ටෙරා වේ.
(4) ඩික්ටියොප්ටෙරා වේ. (5) හෙටරොප්ටෙරා වේ. (......)

05 ද්වි වාර්ෂික වල් මර්දනයට වඩාත් සුදුසු ක්‍රමය වන්නේ,

(1) බිම් සැකසීමට පෙර වල් ගැසීමය.
(2) බෝග සිටුවීමට පෙර ස්පර්ශ වල් නාශක යෙදීමය.
(3) වර්ෂා කාලය ආරම්භ වීමට පෙර වල් පැළ පිලිස්සීමය.
(4) වල් පැළ ජීවන චක්‍රයේ පළමු වර්ෂයේ දී ගලවා දැමීම ය.
(5) ඉහත සඳහන් කිසිවක් නොවේ. (......)

06 කාලගුණික මධ්‍යස්ථානයක දිනපතා දත්ත සටහන් කරනුයේ,

(1) පෙ.ව. 8.00 ට පමණි. (2) පෙ.ව. 9.00 ට සහ ප.ව. 4.00 ට ය.
(3) මධ්‍යහ්න 12.00 ට පමණි. (4) පෙ.ව. 8.00 සහ ප.ව. 4.00 ට ය.
(5) පෙ.ව. 9.00 ට පමණි. (......)

PAPERMASTER.LK

07 පොලිතින් ගෘහ තුළ දී ශාක අතු කැබලිවල මුල් ඇදීම ප්‍රවර්ධනය වනුයේ ප්‍රධාන වශයෙන්,

(1) අඩු ආර්ද්‍රතාව සහ වැඩි ආලෝක තීව්‍රතාව නිසාය.
(2) අධික ආර්ද්‍රතාව සහ ඉහළ උෂ්ණත්වය නිසාය.
(3) අඩු ආර්ද්‍රතාව සහ පළිබෝධවලින් ආරක්ෂා වීම නිසාය.
(4) ඉහළ උෂ්ණත්වය හා පළිබෝධ සහ රෝග වලින් ආරක්ෂා වීම නිසාය.
(5) අධික ආර්ද්‍රතාව සහ අඩු ආලෝක තීව්‍රතාව නිසාය. (......)

08 ධාන්‍ය ගබඩා කිරීමට වඩාත් උචිත තත්ත්ව වනුයේ,

(1) අඩු උෂ්ණත්වය හා මධ්‍යම ආර්ද්‍රතාවය. (2) අඩු උෂ්ණත්වය හා අඩු ආර්ද්‍රතාවය.
(3) මධ්‍යම උෂ්ණත්වය හා මධ්‍යම ආර්ද්‍රතාවය. (4) අඩු උෂ්ණත්වය හා ඉහළ ආර්ද්‍රතාවය.
(5) මධ්‍යම උෂ්ණත්වය හා අඩු ආර්ද්‍රතාවය. (......)

09 සමහර දිලීර, සජීව පටක මත පමණක් යැපෙයි. මෙම දිලීර කාණ්ඩය වඩාත් හොඳින් හැඳින්විය හැක්කේ,

(1) පරපෝෂිත ලෙසය. (2) වෛකල්පිත පරපෝෂිත ලෙසය.
(3) අනිවාර්ය පරපෝෂිත ලෙසය. (4) අනිවාර්ය මෘතෝපජීවී ලෙසය.
(5) මෘතෝපජීවී ලෙසය. (......)

10 AV = ශාකයකට ලබා ගත හැකි ජලය, FC = ක්ෂේත්‍ර ධාරිතාව, WP = මැළවීමේ අවධි, SP = සංතෘප්ත අවස්ථා සහ MHC = උපරිම ජලාකර්ෂක සංගුණකය නම්, ශාකයට ලබාගත හැකි ජලය සඳහා සමීකරණය වන්නේ,

(1) AV = SP - WP (2) AV = FC - WP (3) AV = WP - MHC
(4) AV = FC - MHC (5) AV = SP - FC (......)

11 අන්තර් නිවර්තන අභිසාරී කලාපය ශ්‍රීලංකාවට වඩාත් සමීපව පිහිටන්නේ,

(1) අන්තර් මෝසම් කාලයේ දී ය. (2) අගෝස්තු හා සැප්තැම්බර් මාසවල දී ය.
(3) වසරේ වියළි මාසවල දී ය. (4) නිරිත දිග මෝසම් කාලයේදී ය.
(5) ඊසාන දිග මෝසම් කාලයේදී ය. (......)

12 එළ දෙනකගේ මද චක්‍රයේ සාමාන්‍ය දිග වනුයේ,

(1) දින 30 කි. (2) දින 28 කි. (3) දින 21 කි. (4) දින 18 කි. (5) දින 15 කි. (......)

13 පසෙ $P^H$ අගය 4 දක්වා පහත ගිය අවස්ථාවලදී පවා ශාකයට ලබා ගතහැකි අත්‍යවශ්‍ය මූලද්‍රව්‍ය වනුයේ,

(1) Ca (2) Mg (3) Fe (4) K (5) S (......)

14 ට්‍රයිග්ලිසරයිඩ ව්‍යුත්පන්න වන්නේ,

(1) ග්ලූකෝස් + මේද අම්ල මඟිනි. (2) ග්ලිසරෝල් + ග්ලූකෝස් මඟිනි.
(3) ග්ලිසරෝල් + මේද අම්ල මඟිනි. (4) ග්ලයිකෝජන් + සිට්රික් අම්ල මඟිනි.
(5) ග්ලයිකෝජන් + ඇමයිනෝ අම්ල මඟිනි. (......)

15 අවධි දිවා දිගට වඩා දිවා කාලය දිග වැඩි වූ විට දිග දින ශාක වල,

(1) අතු බෙදීම ඇරඹේ. (2) සංසේචනය ඇරඹේ. (3) පරාගනය ඇරඹේ.
(4) පත්‍ර පතනය ඇරඹේ. (5) පුෂ්පීකරණය ඇරඹේ. (......)

16 ශාකවල ද්විගෘහිතාව අනුවර්තනය වී ඇත්තේ,

(1) අලිංගික ප්‍රජනනය සඳහාය. (2) ස්වපරාගණය සඳහාය.
(3) පරපරාගණය සඳහාය. (4) කෘමි පරාගණය සඳහාය.
(5) ස්වාභිජනනය සඳහාය. (......)

PAPERMASTER.LK

17 සයිලේජ් සෑදීම යනු,

(1) කෘත්‍රිම ද්‍රව්‍ය එකතු කිරීම මඟින් තෘණ සංරක්ෂණය කරන ක්‍රමයකි.

(2) කිරි ගවයින් සඳහා පිළියෙල කරන විශේෂ ආහාරයකි.

(3) ගව නැම්බියන් සඳහා පිළියෙල කරන සමතුලිත ආහාරයකි.

(4) තෙත් ආකාරයෙන් තෘණ සංරක්ෂණය කරන ක්‍රමයකි.

(5) වියළි ආකාරයෙන් තෘණ සංරක්ෂණය කරන ක්‍රමයකි. (......)

18 කෘෂි නිෂ්පාදනය සඳහා සම්පත් ප්‍රශස්ත ලෙස යොදා ගන්නා වගා ක්‍රමයක් වනුයේ,

(1) උඩු වගාවයි. (2) පුරන් කිරීමයි.

(3) සංරක්ෂණ බිම් සැකසීමයි. (4) බෝග මාරුවයි.

(5) අවම බිම් සැකසීමයි. (......)

19 ගොවිපළ සතුන්ගේ වර්ධනය සහ නිෂ්පාදනය කෙරෙහි බලපාන වඩාත් වැදගත් පාරිසරික සාධකය,

(1) දිවා කාලයේ දිගයි. (2) පරිසර උෂ්ණත්වයයි.

(3) සුළඟේ දිශාවයි. (4) වර්ෂාපතනය සහ එහි ව්‍යාප්තියයි.

(5) සාපේක්ෂ ආර්ද්‍රතාවයි. (......)

20 ශ්‍රී ලංකාවේ වියළි කලාපය තුළ බිංදු ජල තාක්ෂණය යටතේ වගා කිරීමට ඉතාමත් සුදුසු බෝගයක් වනුයේ,

(1) එළවු ය. (2) මෙනේරි ය. (3) අන්නාසි ය. (4) වී ය. (5) තල ය. (......)

21 වී වගාව සඳහා බිම් සැකසීමේ දී පසේ ව්‍යුහය,

(1) වැඩි දියුණු වේ. (2) විනාශ වේ. (3) සුසංහනය වේ.

(4) වෙනස් නොවේ. (5) අඩු වේ. (......)

22 පළතුරු හා එළවලු පරිරක්ෂණයේ දී සුබ්‍රීකරණය සිදු කරනුයේ,

(1) ක්ෂුද්‍ර ජීවීන් අක්‍රීය කිරීමටය. (2) භෞතික හානි අවම කිරීමටය.

(3) රසායනික ක්‍රියා උත්තේජනය කිරීමටය. (4) එන්සයිම අක්‍රිය කිරීමටය.

(5) ද්‍රව්‍යය මෘදු කිරීමටය. (......)

23 හේන් ගොවිතැන,

(1) දේශගුණික විපර්යාසවලට බලපෑමක් නොකරයි.

(2) යනු භූමියේ අඛණ්ඩව වගා කරන ක්‍රමයකි.

(3) අඩු ගහන ඝනත්වයෙන් යුත් ජනතාවකට උපකාරී නොවේ.

(4) වනාන්තර හා තෘණ භූමි විශාල වශයෙන් විනාශ කරයි.

(5) මිශ්‍ර බෝග වගාවට උදාහරණයක් ලෙස සැලකිය හැකිය. (......)

24 රසායනික (එන්සයිමීය) ජීර්ණය ප්‍රධාන වශයෙන් සිදු වන්නේ,

(1) බහු නැමිය, අමාශය හා කුඩා අන්ත්‍රය තුළය. (2) පූර්වාමාශය, ශේෂාන්ත්‍රකය හා වටනය තුළය.

(3) විතංශිකාව, ග්‍රහණිය හා මහාන්ත්‍රය තුළය. (4) බහු නැමිය, ග්‍රහණිය හා කුඩා අන්ත්‍රය තුළය.

(5) ඉහත සියල්ලේම වේ. (......)

25 බීජ බැංකු වැදගත් වන්නේ,

(1) සංවර්ධනය වන රටවලට ණය ලබා දීමටය.

(2) ප්‍රවේණික විවිධත්වය ආරක්ෂා කිරීමටය.

(3) ගොවීන්ට ජාන විරණය කළ බෝග ලබා දීමටය.

(4) සංවර්ධනය වන රටවල මුදල් තැන්පත් කිරීමටය.

(5) ඒක බෝග නිෂ්පාදනය ආරක්ෂා කිරීමටය. (......)

PAPERMASTER.LK

26 ගොවියෙක් මිරිස් පැළ මිලදී ගෙන තම ගෙවත්තේ වගා කළේය. සති කිහිපයකට පසු පැරණි පත්‍ර කහ ගැන්වී තිබුණු අතර අලුත් පත්‍ර කොළ පැහැයෙන් හා නිරෝගීව පවතින බව නිරීක්ෂණය කළ අතර මීට වඩාත් බලපෑ හැකි හේතුව වනුයේ,

(1) පොස්පේට් ඌනතාවයි. (2) කැල්සියම් ඌනතාවයි.
(3) පැළ, පසේ වඩාත් මතුපිට සිටුවීමයි. (4) පැළ පසේ වඩාත් ගැඹුරට සිටුවීමයි.
(5) නයිට්‍රජන් ඌනතාවයි. (......)

27 විදින හා යුෂ උරාබොන කෘමි පළිබෝධකයින් වාර්තා වන ගොනු වනුයේ,

(1) ලෙයිඩොප්ටෙරා, ඕතොප්ටෙරා සහ ඩිප්ටෙරා වේ.
(2) හොමොප්ටෙරා, හෙමිප්ටෙරා සහ ඩිප්ටෙරා වේ.
(3) ඕතොප්ටෙරා, කෝලියොප්ටෙරා සහ ඩිප්ටෙරා වේ.
(4) ලෙපිඩොප්ටෙරා, හොමොප්ටෙරා සහ හෙමිප්ටෙරා වේ.
(5) කෝලියොප්ටෙරා, හොමොප්ටෙරා සහ හෙමිප්ටෙරා වේ. (......)

28 පූර්ණ රූපාන්තරණය දක්වන කෘමි ගෝත්‍ර වනුයේ,

(1) කෝලියොප්ටෙරා, හොමොප්ටෙරා සහ හෙමිප්ටෙරා වේ.
(2) ඕතොප්ටෙරා, ලෙපිඩොප්ටෙරා සහ කෝලියොප්ටෙරා වේ.
(3) ඩිප්ටෙරා, කෝලියොප්ටෙරා සහ හෙමිප්ටෙරා වේ.
(4) ලෙපිඩොප්ටෙරා, ඩිප්ටෙරා සහ කෝලියොප්ටෙරා වේ.
(5) හොමොප්ටෙරා, හෙමිප්ටෙරා සහ තයිසෙනොප්ටෙරා වේ. (......)

29 කෘෂි පාරිසරික කලාප සිතියම් කිරීමේ ප්‍රධාන වාසි වනුයේ,

A - ඒකාකාරී කාලගුණික තත්ත්ව ඇති කලාප හඳුනාගත හැකිය.
B - එක් එක් කලාපයට උචිත බෝග නිර්දේශ කිරීමට හැකිවීමය.
C - උපරිම අස්වනු ලබා ගැනීම සඳහා කාලගුණික සාධක හැසිරවීමට පහසු වීමය.

ඉහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි වනුයේ,

(1) B හා C පමණි. (2) C පමණි. (3) A හා B පමණි. (4) A පමණි. (5) B පමණි. (......)

30 තැනිතලා පිටාර තැන්නක, භෂ්ම සංතෘප්තතාව 60% - 90% ක් වූ අලු පැහැති පසක් දක්නට ලැබුණි. මෙම පස වඩාත් හොඳින් පැහැදිලි කළ හැක්කේ,

(1) පහන් හියුමික පසක් ලෙසය. (2) අපරිනත දුඹුරු ලෝම පසක් ලෙසය.
(3) සොලෝඩයිස් සොලොනෙට්ස් පසක් ලෙසය. (4) දියලූ පසක් ලෙසය.
(5) ග්‍රැමුසොලොස් පසක් ලෙසය. (......)

31 මී කිරි වල අඩංගු මේද ප්‍රතිශතය,

(1) 4% 5% කි. (2) 12% ට වඩා වැඩිය. (3) 2% 3% කි.
(4) 6% 8% කි. (5) 10% 12% කි. (......)

32 පාංශු වයනය යනු,

(1) පසක ඛණිජ අංශුවල ප්‍රතිශත ව්‍යාප්තියයි.
(2) පසක වැලි, රොන්මඩ සහ මැටි අංශුවල සාපේක්ෂ ප්‍රතිශත ව්‍යාප්තියයි.
(3) පසක මැටි, රොන්මඩ සහ කාබනික ද්‍රව්‍යවල ප්‍රතිශත ව්‍යාප්තියයි.
(4) පසක රොන්මඩ, මැටි සහ වැලි අංශුවල අනුපාතයයි.
(5) මතුපිට පසේ ඛණිජ අංශුවල සාපේක්ෂ ව්‍යාප්තියයි. (......)

PAPERMASTER.LK

33 ජල ඌනතාවය සහිත ප්‍රදේශයකට වඩාත්ම ගැලපෙන බෝගය වන්නේ,

(1) කෙසෙල් ය. (2) දුම්කොළ ය. (3) සෝයා බෝංචි ය.

(4) උක් ය. (5) මුං ය. (......)

34 සේවනයෙන් තොරව ඵල හටගැනීම හඳුවනුයේ,

(1) බහුයෝගීතාව ලෙසය. (2) ජලාබුජතාව ලෙසය.

(3) නිමල යෝගීතාව ලෙසය. (4) පාතනෝඵලනය ලෙසය.

(5) විසංයෝගතාව ලෙසය. (......)

35 ආහාර ගන්නා අතරතුරදී ශාකවලට වයිරස් සහ බැක්ටීරියා බෝ කරන කෘමීන් වන්නේ,

(1) කුරුමිණියන් ය. (2) දළඹුවන් ය. (3) කුඩිත්තන් ය.

(4) සලබයන් ය. (5) මකුළුවන් ය. (......)

36 අඩු සාපේක්ෂ ආර්ද්‍රතාවක් සහිත ප්‍රදේශයක සිටින ගොවියෙක් තම ගෙවත්තෙහි වැඩි සාපේක්ෂ ආර්ද්‍රතාවක් යටතේ වැවෙන බෝගයක් වගා කිරීමට අපේක්ෂා කරයි. ඔහුගේ වගාවට වඩාත් සුදුසු වන්නේ,

(1) වර්ධන මලු ය. (2) පොලිතින් නළ ය. (3) දැල් ගෘහයකි.

(4) උණුසුම් පාත්ති ය. (5) එල්ලෙන පෝච්චි ය. (......)

37 සත්ත්ව ආහාරවල අඩංගු ශක්ති පරිපූරක වලට උදාහරණයක් වන්නේ,

(1) තිරිඟු පිටි, මොලැසස් සහ සෝයා වේ.

(2) තිරිඟු පිටි, සත්ත්ව තෙල් හා කුකුළු අතුරු ඵල වේ.

(3) බඩ ඉරිඟු ඇට, සහල් නිවුඩු සහ පොල් තෙල් ය.

(4) මඤ්ඤොක්කා අල, තල පුන්නක්කු සහ සුනු සහල් ය.

(5) මත්ස්‍ය කුඩු, මස් කුඩු සහ රුධිරය ය. (......)

38 බීජ සුප්තතාව ශාකවලට,

(1) බීජ නරක්වීම වළක්වා ගැනීමට උපකාරී වේ.

(2) බීජ වල ජීව්‍යතාව අඩු කිරීමට උදව් වේ.

(3) නිරෝගී බීජ පමණක් වර්ධනය කිරීමට උදව් වේ.

(4) අයහපත් කාල ගුණ තත්ත්ව මඟ හැරීමට උදව් වේ.

(5) බීජ පළිබෝධ උවදුරු වලින් ආරක්ෂා කර ගැනීමට උදව් වේ. (......)

39 ද්වි බීජ පත්‍රී බීජ සම්බන්ධව වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ කුමක් ද?

(1) ඵලාවරණ බීජ වලට තදින් සම්බන්ධවී ඇත.

(2) බීජ ලපය හා අනුද්වාරය දක්නට නැත.

(3) පරිණත බීජයක භ්‍රෑණ පෝෂය දක්නට නැත.

(4) බීජ වර්ටිකාව ලෙස හැඳින්වේ.

(5) බීජ පත්‍ර අල්ප විකසිත පටකයක් බවට පත් වී ඇත. (......)

40 වාත අවකාශය දක්නට ලැබෙනුයේ,

(1) තාරා බිත්තර වල පමණි. (2) කිකිළි බිත්තර වල පමණි.

(3) පැරණි බිත්තර වල පමණි. (4) නැවුම් බිත්තර වල පමණි.

(5) සියලු බිත්තර වලය. PAPERMASTER.LK (......)

41 ආහාර වලට ප්‍රති ඔක්සිකාරක එකතු කරනු ලබන්නේ,
(1) මුඩු වීම සහ එන්සයිම ක්‍රියාකාරීත්වය නැතිවීම වළක්වා ගැනීමටය.
(2) විටමින් සහ එන්සයිම නැතිවීම වළක්වා ගැනීමටය.
(3) මුඩුවීම සහ දුර්වර්ණ වීම වැළැක්වීමට ය.
(4) දුර්වර්ණ වීම සහ එන්සයිම ක්‍රියාකාරීත්වය වළක්වා ගැනීමටය.
(5) ජලය සහ විටමින් නැතිවීම වළක්වා ගැනීමටය. (......)

42 ක්වීනීන් ලබා ගනුයේ,
(1) දුම්කොළ වලිනි. (2) කෝමරිකා වලිනි. (3) කොහොඹ වලිනි.
(4) මිංචි වලිනි. (5) සින්කෝනා වලිනි. (......)

43 කුරුලු උණ රෝගයේ රෝග කාරකයා,
(1) වයිරසයකි. (2) බැක්ටීරියාවකි. (3) ප්‍රෝටෝසෝවාවෙකි.
(4) පරපෝෂිතයෙකි. (5) දිලීරයකි. (......)

44 වර්ධක නිශේධක ශාක හෝර්මෝනය වනුයේ,
(1) ගිබෙරලීන් ය. (2) ඇමයිනෝ අම්ලය (3) ඔක්සීන් ය.
(4) ඇබ්සෙසික් අම්ලය. (5) සයිටෝකයිනින් ය. (......)

45 හොඳ බෝග සංස්ථාපනයක් සඳහා මනාව සකස් කළ පාත්තියක් අවශ්‍ය වනුයේ,
(1) වර්ධකව ප්‍රචාරණය කෙරෙන බෝග වලටය.
(2) කුඩා බීජ සහිත බෝග වලටය.
(3) විශාල බීජ සහිත බෝග වලටය.
(4) සියලුම පළතුරු බෝග වලටය.
(5) ඉහත කිසිවක් සඳහා නොවේ. (......)

46 යූරියා වල අඩංගු නයිට්‍රජන් ප්‍රමාණය 46% වේ. මෙම ක්ෂේත්‍රයට යෙදිය යුතු යූරියා පොහොර ප්‍රමාණය වන්නේ, (යූරියා වල කාර්යක්ෂමතාව 50%)
(1) 50kg/ha කි. (2) 100kg/ha කි. (3) 150kg/ha කි.
(4) 200kg/ha කි. (5) 250kg/ha කි. (......)

47 ශක සෛල තුළ ස්වසනය සිදුවන්නේ,
(1) රයිබොසෝම වලය. (2) වර්ණ දේහ වලය.
(3) හරිතලව වලය. (4) මයිටොකොන්ඩ්‍රියා වලය.
(5) න්‍යෂ්ටියේ ය. (......)

48 පස් සුසංහනය වීමට බලපාන ප්‍රධාන හේතුවක් වනුයේ,
(1) බිංදු ජල සම්පාදනය කිරීමය.
(2) වියළි පසෙහි වාහන ධාවනය කිරීමය.
(3) ඩොලමයිට් එකතු කිරීමය.
(4) තෙත පසෙහි වාහන ධාවනය කිරීමය.
(5) අලුතින් පොහොර යෙදූ පසෙහි වාහන ධාවනය කිරීමය. (......)

49 ශාකයක ජල අවශෝෂණය මූලික වශයෙන් රඳා පවතින්නේ,
(1) සංසක්ති ආසක්ති මතය. (2) සක්‍රීය ප්‍රවාහණය මතය.
(3) උත්ස්වේදන චූෂණය මතය. (4) පොටෑසියම් පොම්පය මතය.
(5) සාන්ද්‍රණ අනුක්‍රමණය මතය. (......)

50 පටක රෝපණයේ දී වඩාත්ම බහුලව භාවිතාවන අර්ධ ඝන ආධාරකය වනුයේ,
(1) ස්කුග් ය. (2) මුරාෂිගෙ ය. (3) මිලාර් ය. (4) ඒගාර් ය. (5) ප්‍රෝලින් ය. (......)

PAPERMASTER.LK

(ලකුණු 2×50=100)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# කෘෂි විද්‍යාව - II

**13 ශ්‍රේණිය** | **කාලය පැය 03 යි.**

- **A** කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (එක් ප්‍රශ්නයකට ලකුණු 10 කි.)

## A කොටස ව්‍යුහගත රචනා

01 (a) පාසලේ කෘෂි විද්‍යාගාරයේ බීජ තොගයක් තිබෙනු ශිෂ්‍යයෙක් දුටුවේ ය. ඔහුට මෙම බීජවල ජීව්‍යතාව පරීක්ෂා කිරීමට අවශ්‍ය විය.

(i) ඉහත සඳහන් බීජ තෝගයේ ජීව්‍යතාව පරීක්ෂා කිරීම සඳහා සුදුසු ක්‍රමයක් නම් කරන්න.

..........................................................................................................................

(ii) බීජ ජීව්‍යතාවට බලපාන ප්‍රධාන සාධක දෙකක් ලැයිස්තු ගත කරන්න.

1. ..........................................................................................................................

2. ..........................................................................................................................

(iii) ප්‍රධාන බීජ සුප්තතා ආකාර දෙකක් නම් කරන්න.

1. ..........................................................................................................................

2. ..........................................................................................................................

(b) පහත දැක්වෙන කිරි නියැදිවල සාමාන්‍ය මේද ප්‍රතිශතය සඳහන් කරන්න.

| කිරි නියැදිය | සාමාන්‍ය | මේද ප්‍රතිශතය |
|---|---|---|
| 1. ප්‍රිෂියන් කිරි | ............................................ | ............................................ |
| 2. මී කිරි | ............................................ | ............................................ |
| 3. එළු කිරි | ............................................ | ............................................ |

(c) එක් එක් ක්‍රමය සඳහා උදාහරණයක් සහිතව, ශ්‍රී ලංකාවේ භාවිතා වන සම්ප්‍රදායික ආහාර පරිරක්ෂණ ක්‍රම දෙකක් ලැයිස්තු ගත කරන්න.

| | ක්‍රමය | උදාහරණය |
|---|---|---|
| 1. | ............................................ | ............................................ |
| 2. | ............................................ | ............................................ |

PAPERMASTER.LK

02 (a) ගව අභිජනනයේ දී කෘත්‍රිම සිංචනයේ ප්‍රධාන වාසි දෙකක් දක්වන්න.

1. ..............................

2. ..............................

(b) අලුත උපන් සතුන්ට මුල්කිරි දීමේ ප්‍රධාන වාසි දෙකක් දක්වන්න.

1. ..............................

2. ..............................

(c) ගව රෝග පැතිරීම වැළැක්වීමට ගත යුතු රෝග පාලන ක්‍රම දෙකක් දක්වන්න.

1. ..............................

2. ..............................

(d) කිරි කල් තබා ගැනීමේ ක්‍රම හතරක් ලැයිස්තු ගත කරන්න.

1. ..............................

2. ..............................

(e) එළවළු කල්තබා ගැනීමේ ක්‍රම දෙකක් ලැයිස්තු ගත කරන්න.

1. ..............................

2. ..............................

03 (a) සත්ත්ව ගොවිපළවල රෝග ඇතිවීම වැළැක්වීම සඳහා ජෛව ආරක්ෂණ ක්‍රම භාවිතය වැදගත් වේ. වාණිජ සත්ත්ව ගොවිපළක භාවිතා කළ හැකි ජෛව ආරක්ෂණ ක්‍රම තුනක් ලියන්න.

1. ..............................

2. ..............................

3. ..............................

(b) කාබනික පොහොර භාවිතයේ අවාසි දෙකක් නම් කරන්න.

1. ..............................

2. ..............................

(c) ශ්‍රී ලංකාවේ ආහාර ලේබල් කිරීමේ රෙගුලාසි වලට අනුව, ආහාර ලේබලයක අඩංගු විය යුතු වැදගත් තොරතුරු තුනක් ලැයිස්තු ගත කරන්න.

1. ..............................

2. ..............................

3. ..............................

PAPERMASTER.LK

(d) රැක්කවීම සඳහා තෝරා ගනු ලබන බිත්තර වල තිබිය යුතු බාහිර සහ අභ්‍යන්තර ලක්ෂණ දෙක බැගින් ලියන්න.

බාහිර ලක්ෂණ

1. ..........................................................................................................................

2. ..........................................................................................................................

අභ්‍යන්තර ලක්ෂණ

1. ..........................................................................................................................

2. ..........................................................................................................................

04 (a) වාණිජ මට්ටමේදී කැපූ මල් වගා කරුවන් අතර ක්ෂුද්‍ර ප්‍රචාරණය ජනප්‍රිය වී ඇත.

(i) ක්ෂුද්‍ර ප්‍රචාරණයෙහි මූලික මූල ධර්මය කුමක් ද?

..........................................................................................................................

(ii) ක්ෂුද්‍ර ප්‍රචාරණයෙහි වාසි තුනක් සඳහන් කරන්න.

1. ..........................................................................................................................

2. ..........................................................................................................................

3. ..........................................................................................................................

(b) යැපුම් ගොවීන් අතර ක්ෂුද්‍ර ප්‍රචාරණය ජනප්‍රිය නොවීමට හේතු 02 ක් සඳහන් කරන්න.

1. ..........................................................................................................................

2. ..........................................................................................................................

(c) දුර්වල පාංශු ගුණත්වයට හේතුවන එක් ප්‍රධාන සාධකයක් වන්නේ පාංශු හායනයයි.

(i) පාංශු හායනය වන ප්‍රධාන ආකාර 02 ක් ලැයිස්තු ගත කරන්න.

1. ..........................................................................................................................

2. ..........................................................................................................................

(d) පාංශු ඛාදනය තීව්‍ර වීමට හේතුවන මානව ක්‍රියාකාරකම් 02 ක් ලැයිස්තු ගත කරන්න.

1. ..........................................................................................................................

2. ..........................................................................................................................

PAPERMASTER.LK

## B කොටස රචනා

- ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. (එක් ප්‍රශ්නයකට ලකුණු 15 කි.)

01 (i) ශ්‍රී ලංකාවේ බහුලව යොදාගන්නා ප්‍රචාරණ ව්‍යුහ මොනවා ද? මේවා එකිනෙකෙහි ඇති ප්‍රධාන වාසි මොනවා ද?

(ii) බෝග නිෂ්පාදනයේ දී තුලිත පොහොර භාවිතයේ වැදගත්කම සඳහන් කරන්න.

(iii) මිශ්‍ර බෝග වගාවේ වාසි සහ අවාසි සඳහන් කරන්න.

02 (i) ශාකයකට අත්‍යවශ්‍ය මූලද්‍රව්‍ය ලැයිස්තු ගත කරන්න. එම මූලද්‍රව්‍ය ශාකයකට අත්‍යවශ්‍ය මන්දැයි පැහැදිලි කරන්න.

(ii) ආහාර නරක්වීමට බලපාන භෞතික සාධක හා එම සාධක පාලනය කරන ක්‍රම විස්තර කරන්න.

(iii) කෘමි නොවන පළිබෝධීන් පාලනය කරන ක්‍රම විස්තර කරන්න.

03 (i) ගවයන්ගේ ස්වාභාවික පට්ටි දැමීමට සාපේක්ෂව කෘත්‍රිම සිංචනයේ වාසි හා අවාසි සඳහන් කරන්න.

(ii) ඔබ ප්‍රදේශයේ බහුලව හමුවන ඖෂධ ශාකයක් නම්කර, එම ශාකයේ ඖෂධීය වටිනාකම විස්තර කරන්න.

(iii) හේන් ගොවිතැනේහි වාසි හා අවාසි විස්තර කරන්න.

04 (i) ජෛව විද්‍යාත්මක පළිබෝධ පාලනයේ වැදගත්කම විස්තර කරන්න.

(ii) ගොවිපොළ සතුන්ගේ හැසිරීම් රටාවට හා ඔවුන්ගේ නිෂ්පාදන මට්ටමට පරිසර සාධක බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(iii) රටක පාරිසරික සමතුලිතතාව පවත්වා ගැනීම සඳහා වනාන්තරවල කාර්යභාරය විස්තර කරන්න.

05 (i) බෑවුම් සහිත ඉඩම් සඳහා යෝග්‍ය පාංශු සංරක්ෂණ ක්‍රම විස්තර කරන්න.

(ii) බීජ සුප්තතාවය යනු කුමක් ද? බීජ සුප්තතාවයට බලපාන සාධක මොනවා ද?

(iii) ජලය මඟින් සිදුවන පාංශු ඛාදන ආකාර විස්තර කරන්න.

06 (i) ශ්‍රී ලංකාව තුළ මුඹ හා කුර රෝගය පැතිරීම වැළැක්වීම සඳහා ගතයුතු ක්‍රියා මාර්ග විස්තර කරන්න.

(ii) පාලිත තත්ත්ව යටතේ බෝග වගා කිරීමේ වාසි මොනවා ?

(iii) පාංශු ඛාදනය යනු කුමක් ද? පාෂාණ, රසායනික ජීර්ණය වන ආකාර විස්තර කරන්න.

PAPERMASTER.LK